# ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මක වන
# පශ්චාත් උපාධි
# අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාවන්හි
# ප්‍රායෝගික ඉගැන්වීම් පුහුණු වැඩ
# පිළිවෙළ පිළිබඳ අධ්‍යයනයක්


අලුත්ගේ දෝන කල්‍යාණි විජයවර්ධන

විද්‍යාවේදී උපාධිය

පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා



UCLIB

470050


*කොළඹ විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන දර්ශනපති උපාධිය*

*සඳහා ඉදිරිපත් කරන ලද පර්යේෂණ නිබන්ධය*

*1997 - 07 - 10*

# සංක්ෂිප්තයෙන්

ජාතියක පිබිදීම පැවැත්ම හා අනාගතය ගුරුවරුන්ගේ මග පෙන්වීම මත රඳා පවතී. එබැවින් ගුරුවරයා සතු කාර්යභාරය අතිශයින්ම වැදගත්ය. සිසුන්ගේ ඉගෙනීමේ කටයුතු වල සාර්ථකත්වය රඳා පවතින්නේ ඉගැන්වීමේ නියුතු ගුරු පිරිස දැනුම කුසලතා ආකල්ප වලින් පරිපූර්ණ වන තරමටය. එබැවින් ගුරුවරයා න්‍යායාත්මක මෙන්ම ප්‍රායෝගික අංශයෙන්ද මනා පුහුණුවක් ලත් තැනැත්තෙකු විය යුතුය. එවැනි කාර්යක්ෂම ගුරු පිරිසක් බිහි කිරීම ගුරු අධ්‍යාපන වැඩ සටහනකින් අපේක්ෂිත කාර්යයකි. එබැවින් උපරිම නිපුණතා වර්ධනයක් සඳහා විවිධ ශිල්පීය ක්‍රම අදාළ අයුරින් යොදා ගැනීමට පුහුණු කිරීම ගුරු අධ්‍යාපනයෙන් සිදුවිය යුතුය. විශේෂයෙන්ම මෑත යුගයේ සංවර්ධනය වෙමින් පවතින රටවල් ගුරු අධ්‍යාපනයේ ප්‍රායෝගික අංශය සංවර්ධනය කෙරෙහි වඩාත් අවධානය යොමු කර ඇත. එබැවින් ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මක වන පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාවන්හි ප්‍රායෝගික ඉගැන්වීම් පුහුණු වැඩ පිළිවෙල, ගුරු කුසලතා වර්ධනය කෙරෙහි කවර මෙහෙයක් ඉටු කිරීමට සමත් වී ඇති ද යන්න මෙම අධ්‍යයනය තුළින් විමර්ශනයට භාජනය කර ඇත.

මෙහිදී පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාවේ ප්‍රායෝගික පුහුණු වැඩ පිළිවෙලින් දැනට ඉටුවන හා එසේම ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු කවරේද යන්න හඳුනා ගැනීම මෙම අධ්‍යයනයේ එක් මූලික අරමුණක් වී ඇත. මීට අමතරව දැනට ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කෙරෙන පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලවන්හි ප්‍රායෝගික ඉගැන්වීම් පුහුණු වැඩ සටහන් සැලසුම් කර ඇති ආකාරය, ක්‍රියාත්මක වන ආකරය හා අධීක්ෂණ ව්‍යවහාරය විමසිල්ලට භාජනය කර ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන් එක් එක් අරමුණු සපුරා ගැනීම සඳහා යොදා ගන්නා ක්‍රම ශිල්ප කවරේද යන්න විමර්ශනයට භාජන කළ හැකි විය.

ආයතන ප්‍රධානීන්ගේද, කථිකාචාර්ය මහත්ම මහත්මීන්ගේද, ගුරු ශිෂ්‍ය ශිෂ්‍යායන්ගේද අදහස් සැලකිල්ලට ගනිමින් හා නව ගුරු අධ්‍යාපන ප්‍රවණතා ඇසුරෙන් ප්‍රායෝගික ඉගැන්වීම් පුහුණු වැඩ සටහන කෙසේ නවීකරණය විය යුතුද යන්න සම්බන්ධයෙන් අදහස් ඉදිරිපත් කිරීමටද හැකි වී ඇත.

එසේම පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාවන්හි ප්‍රායෝගික ඉගැන්වීම් පුහුණු වැඩ පිළිවෙළ සංවර්ධනය කිරීම සඳහා අවධානය යොමු විය යුතු අංශ කිහිපයක් හඳුනා ගැනීමටද හැකි විය.



University of Jaffna
Library
Sri Lanka